**අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 01 - 2018**

**-------------------------------------------------------------------**

**අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ - අදියර 01** 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2013 මාර්තු 14 දින එලඹි අංක එස් එල් -පී 110 දරණ ණය ගිවිසුමේ ව්‍යාපෘති ලියවිල්ලේ 14 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කලයුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.ව්‍යාපෘතියේ අරමුණු වනුයේ අනුරාධපුර උතුර ප්‍රදේශයේ ජල සම්පාදන පද්ධතියක් ඉදිකිරීම මඟින් ආරක්ෂිත පානීය ජලය සැපයීම හා ජල සම්පාදන ආවරණ ප්‍රදේශය වැඩිකිරීම සහ එමඟින් ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයක් හා සෞඛ්‍ය තත්වයක් වර්ධනය කිරීම් වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 11,515 කට සමාන ජපන් යෙන් මිලියන 6,817 ක් වන අතර ඉන් රු.මිලියන 8,726 කට සමාන ජපන් යෙන් මිලියන 5,166 ක් මූල්‍යයනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතානය විසින් එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 පෙබරවාරි මස ආරම්භ කර තිබුණු අතර, 2018 පෙබරවාරි මස වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාල සීමාව 2020 අප්‍රේල් 30 දින දක්වා දීර්ඝ කර ඇත.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීමයන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
ව්‍යාපෘතිය විසින් වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරන අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) 2017 වර්ෂය දක්වා ගෙවා තිබූ එකතුව රු.මිලියන 20.19 ක එකතු කල අගය මත බදු ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන දායකත්වයට එරෙහිව හිලව් කර තිබුණි. තවද ව්‍යාපෘති කටයුතුවලට අදාල නොවන රු.මිලියන 2 ක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වියදම්ද ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන දායකත්වයට එරෙහිව හිලව් කර තිබුණි. | රජයෙන් ලැබෙන දායකත්වය අඩුවෙන් දැක්වීම | ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටි ප්‍රකාරව යෙදවුම් බදු අමාත්‍යාංශයෙන් ලද අරමුදල්වලට එරෙහිව හිලව් කරන ලදී. නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය යටතේ ව්‍යාපෘතිය විසින් ප්‍රජා හා ජල සේවා පිළිබඳ තුන්වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය පැවැත්වීම සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට රු. මිලියන 2 ක් නිදහස් කර තිබුණි. | මහා භාණ්ඩාගාරය වාර්තා සමඟ සැසඳිය හැකි පරිදි ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන මුළු දායක මුදල මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කිරීම අවශ්‍ය වේ. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට පවත්නා විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු මතවූ විනිමය ලාභය රු. මිලියන 65.46 ක් කෙරීගෙන යන වැඩ ගිණුමේ වැරදි ලෙස නිරූපණය කර තිබුණි. | කෙරීගෙන යන වැඩ ගිණුම් අධි ගණනය වී තිබ්ම | අවශ්‍ය නම්, අවශ්‍ය ගිණුම් සටහන් ගිණුම් පොත් වල සටහන් කරනු ලැබේ. | විදේශ විනිමය ලාභ වෙනම නිරූපණය කිරීම අවශ්‍ය වේ |

## 3 භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති ක්‍රියාකාරකම් සංරචක 08 කින් සමන්විත අතර 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය තවදුරටත් සියයට 22.67 ක අඩු ප්‍රගතියක් දක්නට තිබුණි . තවද, ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) සැලසුම් කිරීම ප්‍රමාද වීම සහ ලංසු ලේඛන පිළියෙළ කිරීම සහ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටීන් ක්‍රියාත්මක කිරීමට ගතකල කාලය වැනි | ව්‍යාපෘති දීර්ඝ කිරීමේ කාලය තුළදී | නියමිත කාලය තුළදී කොන්ත්‍රාත් කටයුතු නිම කිරීමට හැකිවන පරිදි | කොන්ත්‍රාත්කරුගේ වැඩ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම |

| | | | |
|---|---|---|---|
| හේතුන් මත 2019 මැයි 31 දිනට ව්‍යාපෘතියේ ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත්තුන් වන ජල තුළමුව පහසුකම, ජල පවිත්‍රාගාරය භූගත ටැංකිය සහ උස්වූ ජල ටැංකි ඉදිකිරීම් සහ රඹෑව හා මැදවච්චියෙහි සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් නල මාර්ග එළීමේ ප්‍රගතිය සියයට 10ක් වැනි අඩු මට්ටමක නිරූපණය විය . මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2020 අප්‍රේල් 30 දිනට ඉතිරිව ඇති මාස 11 ක ව්‍යාපෘති කාලය තුල ව්‍යාපෘතියේ ඉලක්ක ළඟා කර ගැනීමට හැකි වේද යන්න සැක සහිත වේ. | කොන්ත්‍රාත්තුව යටතේ ඇති ක්‍රියාකාරකම් සම්පූර්ණ නොවිය හැක. | කොන්ත්‍රාත්කරු වෙත තදින් උපදෙස් දෙන ලදී | අවශ්‍යවේ |
| (ආ) වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර ඇති වූ අවබෝධතා ගිවිසුමේ 15 ජේදය ප්‍රකාරව, මහකනදරා වැව පුනරුත්ථාපන සහ ජල ප්‍රභවයක් ලෙස භාවිතා කිරීමට යෝජනා කරන ලද උප පද්ධති සඳහා රු.මිලියන 300 ක් ශ්‍රී ලංකා රජය විසින් ලබාදෙන දායකත්වයෙන් ගෙවීමට එකඟ වී තිබුණි. කෙසේවෙතත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඇළ මාර්ගය පුනරුත්ථාපනය සඳහා ලබාදෙන ඉංජිනේරුවරයාගේ ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් 2019 ඔක්තෝම්බර් 15 දක්වා පුනරුත්ථාපන කටයුතු කිසිවක් ආරම්භ කර නොතිබුණි. | අවබෝධතා ගිවිසුම ප්‍රකාරව ඇළ මාර්ගයේ වැඩ ප්‍රමාද වීමේ හැකියාව | වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඇළ පුනරුත්ථාපන කටයුතු සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු ඉදිරිපත් කර නොමැති හෙයින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට කිසිදු ප්‍රතිපාදනයක් නිදහස් කර නොතිබුණි. | වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඉංජිනේරු ඇස්තමේන්තුව ලබා ගැනීමට කඩිනම් පියවර ගත යුතුය |

## 3.2 සම්පත් ඌණ උපයෝජනය

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට මුළු ව්‍යාපෘති කාල පරිච්ජේදය වූ මාස 86 න් මාස 70 ක් ගත වුවද ණය ලබාදෙන ආයතනය විසින් සැපයූ මුළු ප්‍රතිපාදනවලින් ජපන් යෙන් මිලියන 5,166 කට සමාන රු. මිලියන 8,726 කින් ජපන් යෙන් මිලියන 1,519.95 කට සමාන රු. මිලියන 2,116.84 ක් නියෝජනය වන සියයට 29 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, | අතිරේක බැඳීම් ගාස්තු අය කිරීමේ හැකියාව | මෙයට හේතුව ප්‍රසම්පාදන අදියරයේදී පැනනැගුණු ප්‍රමාදයන් වූ අතර ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයට ප්‍රසම්පාදන අදියරේ දී ඇතිවන ප්‍රමාදයන් පාලනය කිරීමට නොහැකි වීමත්ය. | වැඩ කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| ව්‍යාපෘතිය විසින් 2018 දෙසැම්බර් 31 දින දක්වා ණය මුදල් ලැබීම් ප්‍රමාද වීම මත රු. මිලියන 28ක බැඳීම් ගාස්තු ගෙවීම් කර තිබුණි. | | | |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| රඹෑව හා මැදවච්චියහි අධිසනත්ව පොලිඑතලින් නල සපයා එලීම සම්බන්ධ කොන්ත්‍රාත්තුවෙහි කොන්ත්‍රාත් කාලයෙන් මාස 18 ක් නියෝජනය වන සියයට 72 ක් 2019 මැයි 31 දක්වා ගතවුවද, සම්ප්‍රේෂණ නල මාර්ග ඇතිරීම් වූ කි.මී.88 න් කි.මී.43.98 ක් හා බෙදාහැරීම් නල මාර්ග ඇතිරීම් වූ කි.මී.163 න් කි.මී.98.32 ක නල එලීම් වැඩ පමණක් නිම කර ඇතිබවට නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය ප්‍රමාදවීමට ඇති හැකියාව | කොන්ත්‍රාත්කරු විසින් ඔවුන්ගේ කොන්ත්‍රාත් වැඩසටහනට සමගාමීව සතුටුදායක ප්‍රගතියක් පවත්වාගත යුතු බවට කොන්ත්‍රාත්කරු වෙත උපදෙස් දෙන ලදී. කෙසේ වෙතත්, පාස්කු ප්‍රහාරය හේතුවෙන් පුපුරණ ද්‍රව්‍ය ආදිය සඳහා යම් යම් බාධක පැනවීම මත සැලසුම්කරන ලද වැඩ කරගෙන යාමට බාධක ඇති වීම. | කොන්ත්‍රාත්කරුගේ කටයුතු අධීක්ෂණය කිරීමට පියවර ගත යුතුය. |

### 3.4 මත භේදයට තුඩුදෙන කරුණු

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 2018 ජනවාරි 01 දින සිට ව්‍යාපෘති සිවිල් ඉදිකිරීම් කටයුතුවල නියැලෙන කොන්ත්‍රාත්කරුවන් හරහා ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා මෝටර් වාහන කුලී පදනම මත ලබාගෙන තිබුණි. කෙසේ වෙතත්, රු.මිලියන 16.31 කට ව්‍යාපෘතිය විසින් මිලදීගත් මොටර් වාහන 02 ක් හා යතුරුපැදි 2ක් ව්‍යාපෘති කටයුතු සඳහා භාවිතයට ගන්නවා වෙනුවට ජාතික ජල සම්පාදන හා | ව්‍යාපෘති විෂයපථයෙන් බැහැර ක්‍රියාකාරකම් සඳහා වත්කම් භාවිතා කිරීමට ඉඩදීම. | අදහස් දක්වා නොතිබීම | ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති සම්පත් උපයෝජනය කිරීම අවශ්‍ය වේ. |

ජලාපවහන මණ්ඩල ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය වෙත ව්‍යාපෘතිය විසින් භාර දී තිබුණි. එපමණක් නොව ව්‍යාපෘති විෂය පථයෙන් බැහැරව ජල බවුසරයක් කෑගල්ල ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය වෙත භාරදී තිබුණි.